23 වන පිටෙන්

පසුකර යනවිට පන්සලට කිට්ටුව වෙල මැද්දේ ඇති බෝක්කුව ළඟට ශ්‍රීපාදස්ථානය පෙනේ. එතැන නැවතුණු ආච්චිලා අපත් ළඟට එනතුරු සිට '' අන්න බලාපල්ල සිරිපාදෙ' යනුවෙන් පවසා දොහොත් බැඳ වැඳ ''සාදු සාදු සාදු'' යනුවෙන් තෙවරක් පැවසූයේ හිස පහත් කරමින් ය. අපි ද ආච්චිලා අනුව සාදුකාර දුන්නෙමු. ''බ-ද්දෝත්තමයො පයතියපු තැනක්නෙ. අපිට පෝයට ඔහොම හරි වඳින්න ලැබිල තියෙන එක මොන තරම් පිනක්ද? නැද්ද ජේන් අක්කෙ''. අපේ ආච්චි පැවසුවා ය. ආච්චිලා දෙදෙනා නොයෙකුත් ගමේ කතන්දර කටින් පමණක් නොව දෑත දෙපයි-න් ද කියමින් ගමන් කළත්, පන්සල කිට්ටුවට ආවිට කිසිම ශබ්දයක් නොමැති ව බොහෝ ශාන්ත ව පන්සලට යනතුරු ගිය හ. ආච්චිලා සිල් ගන්නා හැටි බලා ඒ අය අනුකරණය කරමින් අපි ද සිල් ගත්තෙමු. ගිලන්පස පූජාව තබන හැටි, මල් පූජා කරන හැටි, පහන් තියන හැටි සියල්ල ආච්චී කළ පිළිවෙළට ම කළෙමු. පන්සලට අනිත් පැත්තේ පාර අයිනේ එක එක වායිව-ාරන්න විසිතුරු බඩු ය. හුළංපෙති දෙකක් මිල දී ගත් මම කාරෙකෙන් දුව ගොස් එකක් මැණිකෙ පොඩිඅම්මාට දෙනු දුටු ආච්චීගේ සිල් මූණ දෙල් විය. වහා පැමිණ, මගේ අතින් හුළං පෙති දෙක උදුරා ගෙන "ඕවා කරන්න ද සිල් ගන්න ආවෙ" කියා ආච්චීගේ පන්මල්ලට දමා ගත්තා ය.

දහවල් දානය වැළඳීමෙන් පසු මම නැවත පාරෙන් අනිත් පැත්තට ගියෙමි. මුදලාලි කෙනෙක් පුංචි ටොපි වගයක් විකුණයි. ඒවා පොඩි ටිෂූ කොළවල ඔතන ලද කටේ ඇලෙන සුළු ටොපි වර්ගයකි. ඔහු ටොපි විකුණන්නේ අමුතු ම විදිහකට ය. අඟල් දෙකක් පමණ පළල, අඟල් හතරක් පමණ දිග ප්‍රමාණයට කපන ලද ටිෂූ කොළ මිටියක් ඔහුගේ අතේ ඇත. එයින් එක කොළයක් හෝ කීපයක් ශත පහ ගණනේ මිල දී ගත යුතු ය. අප තෝරා ගන්නා කොළය, ඔහු එතන ඇති ලාම්පුවකට අල්ලා පුළුස්සයි. පුළුස්සන විට, එය තුළින් ඉලක්කම් මතුවෙයි. ඒ ඉලක්කමෙන් මතුවන ටොපි ප්‍රමාණය එම කොළය මිල දී ගත් අයට ලැබේ.

සත පහක් දී මා ලබා ගත් කොළය දැවෙන විට මතුවුණේ අටේ ඉලක්කම ය. ඒ අනුව මට ලැබුණු ටොපි අට අතට උණ්ඩි කරගෙන බ්රෑම්...බ්රෑම්..බ්රෑම් බ්රෑ..........පීප්...... පීප් හඬින් බණ මඩුව ඇතුළට කාරෙකෙන් ගියෙමි. මැණකෙ පොඩිඅම්මා භාවනාවක ය. ඇයව භාවනාවෙන් නැගිටුවා ගත් මම ඇයට ටොපි දෙකක් දුනිමි. මැණකෙ පොඩිඅම්මා ද භාවනාව පසෙක දමා කරදාසිය ඉවත්කර ටොපියක් කටේ රුවා ගත්තා ය. ඒ විට ම අසල භාවනා කරමින් සිටි කවුදෝ ආච්චි කෙනෙක් වහා නැගිට දුව ඇවිත් "විකන්න එපා සූප්පු කරල කාපල්ල. විකාල බෝජනා කීව මතකයි නේද" යනුවෙන් කරුණාවෙන් රහසින් පවසා මගේ අතේ තිබුණු ටොපි වලින් දෙකක් අතට ගෙන තමා සිටි තැනට ගොස් වාඩිවී දෑත සිල් රෙද්දට මුවා කොටගෙන ටොපියක කඩදාසිය ඉවත්කර වට පිට බලා කටේ දමා යන්තම් සූප්පු කොට නැවත භාවනාවට ඇස් පියා ගත්තා මා බලාගෙන ය.

සවස් වන විට මට පන්සලේ සිටින්ට බැරි තරම් ය. කඩේ චන්ද්‍රදාසලා ගේ මිදුලේ චන්ද්‍රදාස වෙසක් කූඩු එල්ලනවා මට මැවී පෙනේ. පියතිලක බාප්පාත්, ලීලා නැන්දාත්, ශීලා නැන්දාත් මිදුලේ පහන් වැටි දල්වනවා මැවී පෙනේ. අපේ ගෙදර ආතා බකට් කූඩුවක් පොඩි කර ඉටිපන්දම දල්වා දිගඇර කම්බියෙන් එල්ලනවා මැවී පෙනේ. උඩහ කඩේ ළඟ තිබුණු අහස් යාත්‍රාව අහසේ දැන් පියාසර කරනවා ඇත. ගෙදර ගියොත් ආතා සමග බකට් පත්තු කළ හැකි ය.

මෙසේ සිතමින් පාරේ එහාට මෙහාට යනවිට ජේන් ආච්චි සිල් පවාරණ වී ගෙදර යනවා දුටුවෙමි. මම ද ගෙදර යාමට ඇය පිටුපසින් වැටුනෙමි.

මානානේ ජයසිංහ මහතාගේ කඩයට තරමක් කිට්ටුව තැනක පිරිසක් බැලුමක් උඩ යවන්නට හුළං පිඹිති. පන්දමක් පත්තු කර ගත් අයෙක් එම පන්දම බැලුමට යටින් අල්ලා උඩට පාතට ඔසවමින් පාත් කරමින් සිටී. බොහෝ සෙනඟ වට වී ඇති නිසා බැලුමට හුළං පුරවන කෙනා පිටු පසින් ගියෙමි. ඔහු ඇඳ සිටි සරම තුනී එකක් වූයෙන් ඒ අතරින් පන්දම උස් පහත් වන අන්දම පෙනේ. මිනිසාගේ ඔළුවට උඩින් බැලුමේ මුදුන පෙනේ.

බැලුමට උණුසුම් හුළං පුරවා අවසානයේ පන්දම බැලුම ඇතුළින් ගැසූ ඔහු සියල්ලටම ඈත් වන ලෙස අතින් සන් කොට බැලුමට උඩ යන්නට ඉඩ හැරියේ ය. පන්දම සහිත බැලුනය ඉතා පුංචි වන තුරු උඩ බලා ගෙන සිටි අපි නැවත ගමන ආරම්භ කළෙමු.

ගෙදර කිට්ටුවට එන විට උඩහ කඩේ අහස් යානය ගුවනේ දී ගිනිගෙන සැකිල්ලෙහි කොටස් කම්බියක එල්ලෙමින් තිබිණ. මා ගෙදරට එන විට ආතා බිත්ති කණ්ඩිය උඩ පහන් පේලියක් තබා පොල් තෙල් වත් කරයි. පියසීලි පොඩිඅම්මා අපුල්ලපු පරණ සුදු රෙදි කැබැල්ලකින් තිර අඹරන අතර රූපෝති පොඩිඅම්මා පහන්වලට තිර දමමින් සිටියි. ඒ දුටු මා දුවගෙන ඇවිත් ආතා අතේ තිබුණු පොල් තෙල් බෝතලය උදුරා ගෙන පහන් වලට තෙල් දමන්නට පටන් ගතිමි. ආතා ගිනිකූරකින් එක පහනක් දල්වා, එම පහනින් අනිත් පහන් පත්තු කරයි.

ටික වේලාවකින් පන්සල පැත්තේ සිට පැමිණි කවුදෝ උපාසිකාවක් අපේ ගේ ළඟ නැවති, "පොඩිඑකා පන්සලේ නැතිවෙල පුංචිනෝනක්ක පොලොවෙ හැපි හැපි හොයනවා"යි ආරංචිය ගෙනාවා ය.

මා කළ හිතුවක්කාර වැඩේ බරපතල කම දැනුණේ එවිට ය. වහා ක්‍රියාත්මක වූ ආතා අල්ලිස් මාමාගේ අළුත් ම අළුත් රැලේ බයිසිකලය ඉල්ලා දී මාමා පිටත් කර මා ගෙදර ඇවිත් ඇති පණිවිඩය පන්සලට යැව්වේ ය. බයිසිකලයට නැගුණු මාමා බෙල්එක ගසා කන්දට ඉගිල්ලී යනවා මා බලාගෙන ය.

පැයක් විතර යනකොට ආච්චි මැණිකෙ පොඩිඅම්මාත් සමග ගෙදර ආවේ කේන්තියේ පුපුරමින් ය. "අද මේ උතුම් පෝය දවසෙ සීලයක් භාවනාවක් කර ගන්න හැටියක් නෑ මේ දේවදත්තය හින්ද. කෝ මූ " කියාගෙන ආච්චි ගෙට ගොඩ වූවාය. මා ඔළුව බිමට හරවාගෙන ඇස් දෙකෙන් පමණක් ආච්චිගේ මූණ දෙස බලාගෙන, එක කකුලක් පිටි පස්සට තබාගෙන හිටියේ ගහන්න පැන්ණොත් දුවන්න බලාගෙන ය. එහෙත් "අද සිල් ගත්තු දවසේ පව් පුරවා ගන්නට බැරිය " කියා ඇය මට ගැහුවේ නැත.

ආච්චිට පණිවිඩය කියන්නට ගිය මාමා මහ රෑ වන තුරුත් පැමිණියේ නැත. ඔහු ගැන දැන් ආච්චිගේ පඤ්චස්කන්ධය ම ගිනි ඇවිලෙයි. "අම්මප දෙයියනේ ලොකු කොලුව කොහේද ගියේ. පොඩි එකා ගෙදර ආව කියල ආපහු ඒ එක්කම ආව එකනෙ. " "කොහේවත් අලහොදි ගහන්නවත් ගියාද - ඒත් අද මේ බුදුරැස් විහිදෙන දවසෙ කවුද අලහොදි විකුණන මහසෝන." " දැන් අර අල්ලිස් සිංඤෙදා් කී සැරයක් ආවද?" ඇය විටින් විට කුමක් හෝ කියයි. පාරට බැස උඩහ බලයි. ඒත් මාමා ආවේ නැත.

පසුවදා උදේ පාන්දර මාමාව හොයන්න යන්න අල්ලිස් මාමා ඇතුළු කීප දෙනෙක් ලැහැස්ති ය. තවත් බයිසිකල් හොයාගෙන තොටුපළේ ධම්දාස බාප්පා, තොටුපළේ ලෙයස් අයියා, ගුණතිලක බාප්පා ආදී කීප දෙනෙක් දැන් එක එක පැති වලට යාමට සූදානම් ය. උඩහ කඩේ පැත්තේ සිට එක විට ම පහළට බයිසිකලයෙන් වේගයෙන් ආවේ මාමා ය. කෙළින්ම අල්ලිස් මාමලාගේ ගෙදරට බයිසිකලය දීමට යන විට ම අපේ වත්තේ සිටි පිරිස ඒ ගෙදරට ගියේ වෙච්ච සිද්දිය දැන ගැනීමේ කලබලයෙනි. ඒ අය අල්ලිස් මාමලාගේ ගෙදරින් එළියට බැස්සේ මාමා ට බැණ බැණ ය. මාමා කළුතර, වාද්දුව, පානදුරය, හොරණ ආදී නගරවල එළිවෙනතුරු වෙසක් බලා ඒ ගෙදරට ආ වේලාව ය. මාමා දුටු ආච්චිගේ හිතේ මල් පොකුරු ය. ''කුණුහරුප'' කියන ජාතිය වැඩියෙන්ම මගේ කනට මුලින් ම ඇසුණේ ඒ වෙසක්දාට පසුවදා හිමිදිරි පාන්දර ආතාගේ මුවින් ය.

## මානවඩු ගේ මාසය




12 වන පිටෙන්

අසලට ආ තාත්තා ''අද එක්කෙනෙක් එයාගේ තාත්තව ඇඳලා තිබුණනේ" යි නිවසේ සියළු දෙනාටම ඇසෙන සේ උස් හඬින් පවසන විට මගේ සර්වාංගයම සීතල වී ගියේය. මට මුහුණ ලා මේසයේ එහා පැත්තේ වාඩි වී සිටි අක්කාගේ ප්‍රශ්නාර්ථයක් රැඳි දෙනෙත් ම වෙත යොමු වී තිබිණි. අඩ අඳුරේ සිටි තාත්තා දෙස කෙලින් බැලීමේ අපහසුතාවයෙන් මා පෙළිණි. මම අත තිබූ පොතෙන් ඔහු නොපෙනෙන සේ මුහුණ ආවරණය කර ගතිමි.

''ඒ කවුද ?" යි අසාගෙන කුස්සියේ සිටි අම්මා මේසය අසලට ආවාය.
ඈ ''ඒ කවුද ?" යැයි ඇසුවද ඇගේ දෙනෙත් මා වෙත යොමු වී තිබුණේ චිත්‍ර ඇඳීමට දක්ෂතාවය තිබුණේ මට බව ඈ දන්නා හෙයිනි.

''හැබැයි ඒ මං නම් නෙවෙයි. මං කලිසම් අඳින්නෙත් නෑ. මට කාර් එකක් ඇත්තෙත් නෑ"යි පැවසූ තාත්තා උස් හඬින් සිනාසිනි. එදා ඔහුගේ ඒ සිනා හඬ අපේ ගේ පුරාම රැව් පිලි රැව් දුන් අන්දම මට අද ද සිහිපත් වේ. මා තුළ එදා ඇති වූයේ කිව නොහැකි තරම් ලැජ්ජාවකි. සියල්ලන්ගෙන්ම පලා ගොස් සැඟවෙන්නට ඇත්නම් යයි මට සිතිනි. මම පොත තව තවත් මුහුණට ලං කරගෙන කොපමණ වෙලා මේසය ළඟ සිටියාදැයි නොදනිමි.

තාත්තා සිනාවූයේ මටද නැතිනම් තමා කෙරෙහි උපන් ආත්මානුකම්පාවෙන්දැයි මම අද වනතුරු නොදනිමි. තාත්තා චිත්‍ර ගුරුවරයාගෙන් මගේ චිත්‍රය ඉල්ලාගෙන බලන්නට ඇතැයි මම කිසිසේත්ම නොසිතුවෙමි. චිත්‍ර තරඟය ගැන දැනගෙන සිටි ඔහු හට තම දියණිය තමාව චිත්‍රයට නගා ඇත්තේ කෙසේදැයි දැක ගැනීමේ, අන් ඕනෑම පියෙකුට ඇතිවන අන්දමේ ආසාවක් සිතේ පැන නගින්නට ඇත. සමහර විට චිත්‍ර ගුරුවරයා විසින් ම විශේෂයෙන් ම එය තාත්තාය පෙන්වන්නට ඇතුවා විය හැක. එය සිදුවූයේ ගුරු කාමරයේදී නම් තාත්තාගේ මිතුරු ගුරු භවතුන්ගේ සරදමට අනිවාර්යයෙන්ම ඔහු ලක් වන්නට ඇත. ජාතික ඇඳුම අඳින තමාව තම දියණිය විසින් ම නිගරුවට ලක් කර ඇති අන්දම පිළිබඳව ඔහු තුළ මා කෙරෙහි එදා ඇතිවූ කළකිරීම කොතරම්දැයි සිතා ගැනීමට මම ඔබට භාර කරමි.

තාත්තාට මගෙන් සිදුවූ වැරැද්ද නිවැරදි කරන්නට මම එදා සිට අද දක්වාම නොයෙක් අයුරින් වෙහෙසෙ දරමි. චිත්‍රය පිළිබඳ පලහිලව්ව එදා එම සිද්ධියෙන් නිමාව දුටුවද මගේ සිතේ ඒ පිළිබඳව ඇඳී අත්තේ කිසිදා නොමැකෙන අඳුරු සිත්තමකි. මගේ සිතේ මෙන් නොව තාත්තගේ සිතේ ඒ පිළිබඳ මතක ශේෂයන් නැතිව ඇතැයි සිතා හිත හදාගන්නට මම වෙහෙසෙමි. තාත්තාගේ ජාතික ඇඳුම ගැන මගේ සිතේ ගෞරවක් ඇතිබව අඟවන්ට මම මගේ රැකියා-වේ මුල්ම පඩියෙන් ඔහුට නැෂනල් සූට් එකකට රෙදි ගෙනත් දුන්නෙමි. අවුරුද්දට තෑගි බෝග ගන්නා විට පිටකොටුවේ ඇවිද ද්‍රවිඩ සාප්පුවකින් රන්වන් පාට ඉර සහිත් අගනා නිමාවෙන් යුතු සුදු වේට්ටි මිල දී ගන්නෙමි. මගේ පුතුට පුංචි ජාතික ඇඳුමක් මසා දී එය අන්දවා ගත් ඡායා රූපයක් ද තාත්තාට තැපැල් කර හැරියෙමි. මේ කිසි එකකින්වත් තාත්තාට එදා සිදුවූ සිත් රිදීම ඉල්ලා අස්කර ගැනීමට පිළිවන් වූවා යැයි මම නොසිතමි.

අනෙක දැන් තාත්තා මගුලක් වැනි වැදගත් කාරණාවකදී මිස පෙර මෙන් නිතර කමිසය හා වේට්ටිය නොහදී. මා තෑගි දුන් රෙදිවලින් පවා නැෂනල් සූට් මසා ගත්තාදැයි මම නොදනිමි. ඒ ගැන ඔහුගෙන් විමසීමට තරම් මගේ චිත්ත ධෛර්‍ය පුබුදුවා ගැනීමට මම පොහොසත් නැත. දැන් ඔහු මහළු නිසා පෙරමෙන් වේට්ටිය පටලවාගෙන ගමන් බිමන් යාම අපහසු හෙයින්දෝ අඳින්නේ නැෂනල් කමිසය සමග සුදු සරමකි. එහෙත් ඉස්සර ඇඳි ජාතික ඇඳුම් කට්ටල ඔහුගේ අල්මාරියේ පිළිවෙළට අසුරා ඇත. අවුරුද්දට දරු මල්ලන් ද කැටුව ගමට යන මම නිව-සේ දින දෙක තුනක් ගත කරන්නෙමි. තාත්තගේ කෞතුක භාණ්ඩ නරඹීමේ ආසාවෙන් තවමත් පෙළෙන මම ඔහුගේ අල්මාරියේ දොර විවෘත කර බලමි. මගේ නෙත් යැවෙන්නේ එක පිට එක අසුරා ඇති පරණ නැෂනල් කමිස ගොඩටය. ඒවායේ කරට අල්ලා ඇති කළු පැහැති කුඩා බොත්තම් මම ඇඟිලි තුඩුවලින් ස්පර්ශ කර බලන්නෙමි. මගේ සිත දිව යන්නේ අතීතයටය.

තාත්තා පාසල් යාම සඳහා පාපැදියේ නැග සීතාවක පාලම මතින් ගමන් කරයි. රණතුංග සර්ගෙ වොක්ස්වගන් රථය නලාව ශබ්ද කරමින් ඈතින් එනු පෙනේ. පාලම පටු බැවින් තාත්තා පා පැදියෙන් බසී. මොටර් රථය තාත්තා ඉස්සර කරනු පෙනේ. මම සීතාවක මැදි විදුහලේ හතරවන පංතියේ අසුන් ගෙන සිටිමි. චිත්‍ර ගුරුවරයා මා අතට සුදු කඩදාසියක් පත් කරයි. මම වහා පැස්ටල් කූරක් ගෙන මහත් ආශාවෙන් ජාතික ඇඳුම ඇඳ පා පැදියෙන් පාසලට යන ම පියාණන්ව එහි සිතුවම් කරමි. චිත්‍ර සර් එය තාත්තා අතට පත් කරන්නෙ-න්,
''බලන්නකො අමරවීර මහත්තයා ඔයාගේ දෝණියන්දා ඔයාව ඇඳලා තියෙන අපූරුව." යයි මා පසසමිනි. තාත්තා නොයිවසිල්ලෙන් එය අතට ගනී.ඔහුගේ මුහුණ උදෑසන කුසුමක් පිපි එන්නාක් මෙන් සිනාවක් නැගේ. මගේ නෙතට කඳුලු ගලා එනු මට දැනෙයි. මම වටපිට බලා තාත්තාට පෙනේදෝයි බියෙන් පිට අත්ලෙන් දෑස පිසදාගෙන අල්මාරියේ දොර වසා දමා කාමරයෙන් එළියට පැමිණෙමි. ගෙදරට ගොඩවන පඩි පෙළේ ඉහළම පඩියේ ඉඳගෙන ම පුතු හා දුව තාත්තා හා බර කතාවකය. මට යන්තමින් ඇසෙන පරිදි ඒ කොබෝතුරා කන්ද පිළිබඳව ජනප්‍රවාදයක් තාත්තා විසින් ඔවුන්ට කියා දෙනු ඇති බව මම අනුමාන කරමි. අවුරුදු හමාර වී තාත්තාගෙන් සමුගෙන ආපසු නිවසට එන ගමනේදී සීතාවක වට රවුම අසලදී ඈතින් සුදු හුණු ගෑ සීතාවක විදුහලේ බිත්තිද ඒ අසල පාලමද තුරු වදුළු අතරින් මට නෙත ගැටේ. සීතා නදිය ද එදා අප පාසල් යන විට දුටුවාසේම මනස්කාන්ත ''කොබෝතුරා කන්ද" වට කරමින් නගරය අසලදී වක් වෙමින් සදාතනව ගලා බසින්නීය. එදා සියළු සොබා සෞන්''දර්යය කැටි කරගත් මානියම් ගම අවට වැසි වනය වෙළඳ ආර්ථිකය විසින් ගිලගත් සමාජයක අත්තනෝමතික චර්යාවන්ගෙන් බැටකමින් තැනින් තැන සෝදා පාළු වී තිබුණ ද ඒ සියළු කෙනෙහිලිකම් ඉවසමින් කොබෝතුරා පර්වතය නොසැලී කල්පාන්තයක් මෙලෙස ම නැගී සිටිනු ඇත. තිරසාර අදිටනින් හෙබි ම පියාණෝ ද කොබෝතුරා පර්වතය මෙනි.

'' විශිෂ්ට සිංහල දැනුමකින් හෙබි ගුරුවරයකු වූ තාත්තාගේ ඉංග්‍රීසි පිළිබඳ දැනුම ඒ හා සම නොවුනද ඒ කාලයේ හැටියට යුරෝපීය ඇඳුම ඇඟේ ලා ගැනීමට තරම් එය ප්‍රමාණවත් විය. එහෙත් අනගාරික ධර්මපාලතුමා වැපිරූ සිංහල සිංහල බෞද්ධ පුනරුදයේ එලයන්හි සුවඳ ආඝ්‍රහනය කළ මගේ පියාගේ පරපුරේ ඇත්තෝ ජාතික ඇඳුම ඇඳීම මහත් ආඩම්බරයක් කොට සැලකූහ. තාත්තා සමග ඔහුගේ ළබැඳියන් කීප දෙනෙක්ම ජීවිතය කාලය පුරාම ජාතික ඇඳුම ඇඳීමේ ලා ගිවිස ගත්හ. එහෙත් යටත් විජිත මානසිකත්වයෙන් මිදීමට අපොහොසත් වීමෙන් කලිසම් කමිස ඇඟලා ගැනීමේ ආසාවෙන් පෙළනු ලැබූ ඔවුහු ජාතික ඇඳුමේ ගිවිසුම බිඳ දැමූවද මපියාණෝ තම තිර ප්‍රතිපත්තියෙහි තදින්ම එල්බ සිටියහ. "